2019. 10. 24

# සැප්තැම්බර් මස උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළට

## - අලුත් මාළු, එළවළු, ලොකු ළූණු, කිරිපිටි, අර්තාපල්, දෙහි, සහල් ආදී ආහාර කාණ්ඩයේ ඉහළ මිල ගණන් ඊට හේතු වෙලා

හමීල පෙරේරා

**2019 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, ඊට පෙර මාසයේ පැවති 3.4% සිට 5.0%ක් දක්වා සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කර තිබේ.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මතුපිට උද්ධමනය මනිනු ලබන අතර, 2019 සැප්තැම්බර් මාසයේ මතුපිට උද්ධමනය සඳහා පිළිවෙළින් ආහාර කාණ්ඩයේ 2.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.9%ක දායකත්වයක් ලබාදී ඇත.

කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් මාසයේ 0.9%ක් වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -1.9%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.8%ක් විය. ඒ අනුව, 2019 සැප්තැම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අලුත් මාළු, එළවළු, ලොකු ළූණු, කිරිපිටි, අර්තාපල්, දෙහි, සහල් සහ අමු මිරිස් ආදී ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් බව දෙපාර්තමේන්තුව පවසයි.

